නාඋල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නාඋල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් ශේෂය රු.67,762 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අඩුවෙන් දක්වන ලද ශේෂ ගිණුම් තුළ නිවැරදි කළ යුතු වේ. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිගනිමි. ඉදිරියේදී එම අඩුපාඩු සකස් කර ගන්නා බව දන්වමි. |
| (ආ) | ගිවිසුම් අනුව කඩ කාමර වෙනුවෙන් රඳවාගත් රු.451,957 ක් මූල්‍ය ප්‍රකාශනවල තැන්පත් ලෙස දක්වා නොතිබුණි. | රඳවාගත් මුදල් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතු වේ. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිගනිමි. මෙම මුදල් වසර ගණනාවකට පෙර එළඹි ගිවිසුම් සඳහා රඳවාගත් මුදල් බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ එකතුව රු.59,660 ක් වූ ශබ්දවාහිනී යන්ත්‍රයක් හා අඟල් 24 රූපවාහිනී යන්ත්‍රයක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිගනිමි. ඉදිරි වර්ෂයේ ගිණුම සකස් කිරීමේ දී වත්කම් යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.3,717,142 ක් වූ ගිණුම් විෂයන් 4 කට අදාළ ශේෂය සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.1,190,774 ක නොසැසඳීමක් පැවතුණි. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් බදු හා සේවක ඇප ආයෝජන පිළිබඳව විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිගනිමි. කඩකුළී නිවැරදි ශේෂය රු.378,735 ක් බවද ආයුර්වේද තොගය රු.151,765 ක් බවද සඳහන් කරමි. |

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකළ ශේෂය රු.1,961,503 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීම කළ යුතු වේ. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ගෙවිය යුතු ගිණුම් | | |
| වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකළ ශේෂය රු114,270 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ශේෂයන් තුළ ආපසු නොගෙවන පුස්තකාල ඇප තැන්පත් මුදල් හා අවදානම් ව්‍යාපෘති සඳහා ලබාගත් ඇප තැන්පත් මුදල් පවතී. |

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.35,168,530 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව අවශ්‍ය උපලේඛන හා සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | හිඟහිටි වරිපනම් බදු උපලේඛන පිළියෙල කළ යුතු වේ. | පරිගණක මෘදුකාංගය මඟින් ලබාගත් වාර්තා මඟින් ශේෂය ලබාගෙන ඇති අතර මේ වන විට වරිපනම් ලේඛන තුලනය කරමින් පවතී. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) 217 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පී.එස්.46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | සභාව සතු වත්කම් සමීක්ෂණයක් සිදුකර ලේඛන පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදී මෙම අඩුපාඩු සකස් කර ගැනීමට කටයුතු කරමි.<br><br>මේ වන විට සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව වත්කම් සමීක්ෂණයක් සිදු කෙරෙමින් පවතී. |
| | (ii) 218 රීතිය | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි මංමාවත්, සුසාන භූමි, ක්‍රීඩාපිටි, පොදු ළිං, නළ ළිං සහ වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සභාව සතු වත්කම් සමීක්ෂණයක් සිදුකර ලේඛන පිළියෙල කළ යුතු වේ. | |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 3 ක ඉන්ධන දහන පරීක්ෂාවක් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කළ යුතු වේ. | ඉන්ධන දහන පරීක්ෂාවක් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 4 ඡේදය | තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව 2013 මැයි 31 දිනැති මහා සභා තීරණයක් පදනම් කර ගනිමින් සභාව සතු කඩ කාමර 48 ක් සඳහා මාසිකව රු.2,000 බැගින් කුලී අයකරමින් පැවතුණි. | තක්සේරු වාර්තා අනුව කුලී අය කළ යුතු වේ. | මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නව තක්සේරුව ලැබී ඇති අතර ඉදිරියේදී නව තක්සේරුව අනුව කුලී අය කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,372,332 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,341,726 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,787,000 | 1,655,539 | 1,488,252 | 1,571,488 | 1,787,000 | 1,655,539 | 1,356,726 | 1,416,942 |
| (ii) | කුලී | 2,010,000 | 892,000 | 2,182,720 | 287,295 | 2,021,800 | 929,550 | 2,000,582 | 260,195 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,010,000 | - | 1,143,740 | - | 1,252,500 | - | 1,291,040 | - |
| (iv) | වෙනත් ආදායම් | 7,053,000 | - | 3,003,690 | 192,853 | 4,880,000 | 1,734,823 | 5,079,887 | 227,636 |
| | එකතුව | 11,860,000 | 2,547,539 | 7,818,402 | 2,051,636 | 9,941,300 | 4,319,912 | 9,728,235 | 1,904,773 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.943,006 ක වරිපනම් අධි ගාස්තු ශේෂය පරිගණක ද්වීගණන දෝෂයක් හේතුවෙන් ඇති වූවක් වුවත්, එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ද්විගණන දෝෂය නිවැරදි කළ යුතු වේ. | වරිපනම් අධි ගාස්තුව ද්වි ගණනයක් වී ඇති අතර එය නිවැරදි කර ගැනීම සඳහා මේ වන විට වසර ගණනාවක ලේඛන තුලනය කිරීම සිදු කෙරෙමින් පවතී. |

2.2.3 කඩ කුලී

----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නාඋල සතිපොළ භූමිය තුළ පිහිටි දීර්ඝ කාලයක සිට වසා දමා තිබූ කඩ කාමර 6 කින් හා පොදු වෙළඳපළේ පිහිටි කාමර 4 කින් රු.339,425 ක හිඟ ශේෂයක් අය කරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිඟ මුදලින් රු.181,390 ක මුදලක් කපා හැරීමට කටයුතු සිදු කරමින් පවතින අතර ඉතිරි හිඟ ශේෂය ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.438,660 ක් හා මුද්දර ගාස්තු රු.4,692,860 ක් විය. | හිඟ මුදල් අය කළ යුතු වේ. | මේ වන විට රු.411,785 ක මුදලක් ලැබී ඇති අතර මුද්දර ආදායම් ද ඉදිරියේදී ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරණු විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ දිනකට එකතු වන කසළ මෙට්‍රික් ටොන් 1½ ත් 2 ත් අතර ප්‍රමාණයක් ඉවත් කිරීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර අක්කර 2 යි රූඩ් 3 ක් වූ පවරා නොගත් සේරුදණ්ඩාපොළ ඉඩමට බැහැර කර තිබුණි. | දෛනිකව එකතුවන දිරන හා නොදිරන කසළ පරිසරයට හානිදායක ලෙස බැහැර නොකර කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ඉඩම සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී. තවද දඹුල්ල මහා නගර සභාව මඟින් යෝජිත කවෂිමා කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා දැනට එකතු කරන දිරන හා නොදිරන අපද්‍රව්‍ය ප්‍රමාණයම යොමු කිරීමට සැලසුම් කර ඇත. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය |

| | | |
|---|---|---|
| | | හැකි පමණ ගබඩා කිරීම සිදු කරමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට 2018 වර්ෂයේ වැය විෂයයන් 3 ක් යටතේ රු.270,000 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා 2018 වර්ෂය වෙන්කර තිබූ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක නොවුණ ද වෙනත් විවිධ වැඩසටහන් යටතේ තිරසාර සංවර්ධන අරමුණුවලට දායක වන කටයුතු සිදුකර ඇත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 16 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු වූ තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සංවර්ධන නිලධාරී, කළමනාකරණ සහකාර පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කරදෙන ලෙස ලිඛිතව ඉල්ලීම් කර ඇත. |
| (ආ) | සේවයෙන් පහකළ හිටපු සභා ලේකම්වරයෙකුගෙන් 2012 වර්ෂයේ සිට අයනොවී පැවත එන රු.199,920 ක සේවක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂය අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2012 වර්ෂයේ වැඩ තහනමට ලක්වූ නිලධාරියෙකුගේ ණය ශේෂය අය කර ගැනීමට ලිපි මඟින් ඔහුව දැනුවත් කර ඇති අතර ඒ සම්බන්ධව ඔහු ක්‍රියා නොකරන්නේ නම් නීතිමය කටයුතු කරමි. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දීර්ඝකාලීනව පරිහරණය කරමින් පවතින ගොඩනැගිලි පිහිටි ඉඩම් 21 ක හා සුසාන භූමිවල අයිතිය තහවුරු කරගෙන නොතිබුණි. | අයිතිය පවරාගෙන ලේඛනගත කර ආරක්ෂාව තහවුරු කර ගත යුතුවේ. | මේ වන විට සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව වත්කම් සමීක්ෂණයක් සිදුකරමින් පවතින අතර අයිතිය තහවුරු කර ගැනීමෙන් පසු මැනුම් කටයුතු සිදුකර සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

3.3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | මොරගහකන්ද සංරක්ෂිත ප්‍රදේශය තුළ පිහිටීම හේතුවෙන් වසා දමා තිබූ කෝන්ගහවෙල මහජන පුස්තකාලයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 20 ක් හා විවිධ වර්ගවල පොත් 5941 ක් එම ගොඩනැගිල්ල තුළ නිෂ්කාර්යව ගබඩාකර තිබුණි. | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා පොත්වල ආරක්ෂාව තහවුරු කිරීම හා එම ද්‍රව්‍ය ඵලදායීව උපයෝජනය කළ යුතු වේ. | මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් ලැබුණු විගස එම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පරිහරණයට ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2016 හා 2017 වර්ෂවලදී ලද රු.250,000 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර තිබූ කිනිහිරිකන්ද ජල යෝජනාක්‍රමය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සම්පූර්ණ කර ජලය බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් ජල යෝජනා ක්‍රමය සක්‍රීය කර ජලය බෙදා හැරීමට කටයුතු කළ යුතු වේ. | 2016 හා 2017 වර්ෂයේ ලැබුණු ප්‍රතිපාදන මත ළිඳ ඉදිකර ජල ගබඩා ටැංකිය ඉදිකර ගුරුත්ව මාර්ගයෙන් ජල ගබඩා ටැංකියට ජලය ලබා ගැනීම සඳහා ජල නල එලීම සිදු කර ඇත. ඉදිරියේදී ප්‍රතිපාදන වෙන් වූ විට ඉතිරි ජලනල යොදා ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට කටයුතු යොදන බව සඳහන් කරමි. |

3.3.3 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 වර්ෂයේ ඕපල්ගල පානීය ජල ව්‍යාපෘතිය ස්ථාපිත කිරීමේ කර්මාන්තය ඉටුකර නොතිබූ නමුත්, 2014 ඔක්තෝබර් මාසයේ ගෙවා තිබූ රු.194,800 ක අත්තිකාරම 2019 අප්‍රේල් 30 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වගකිවයුත්තන් හඳුනාගෙන නිසි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා ගිවිසුම්ගත වුවද ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතියේ වැඩ අවසන් නොකිරීම මත අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු කරන ලද අතර සමථ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. |

3.3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 ප්‍රකාරව ලියාපදිංචිය හා යෝග්‍යතාවය තහවුරු කර ගැනීමකින් තොරව ප්‍රජාපාදක සංවිධාන 7 කට එකතු වටිනාකම රු.1,700,000 ක් වූ කොන්ත්‍රාත් පවරා තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී ඒ අනුව කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 23 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නොවීමට වගබලා ගන්නා බව සඳහන් කරමි. |